www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ නව ආන්ඩුව තුල භේදයන් හට ගනී

## Rifts open up in new Sri Lankan government

**විජේ ඩයස් සහ කේ. රත්නායක විසිනි**
**2004 අප්‍රේල් 16**

ශ්‍රී ලංකාවේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ (එජනිස) නව සුලුතර ආන්ඩුව සිය වැඩකටයුතු ඇරඹීමටත් කලින්, එහි ප්‍රධාන සභාග හවුල්කරුවන් දෙදෙනා ‗ ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංගගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) සහ ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) ‗ අතර තියුනු මතභේද හට ගෙන තිබේ.

පසුගිය සෙනසුරාදා පැවති, කැබිනට් ඇමතිවරුන්ගේ ආකාරගත දිවුරුම් දීමේ උත්සවය, ජවිපෙ විසින්, වර්ජනය කල අවස්ථාව, මෝදු වන භේදයක් ප්‍රසිද්ධියේ ප්‍රදර්ශනය කිරීමක් විය. එජනිස ස්ථාපිත කල අවබෝධතා ගිවිසුමේ කොන්දේසි අනුව, තමන්ගේ අදහස් විමසීමට ශ්‍රීලනිප අසමත්ව ඇතැයි ජවිපෙ නායකයෝ චෝදනා කලහ. ජවිපෙ සඳහා වෙන් කෙරුනු අමාත්‍ය සහ නියෝජ්‍ය අමාත්‍ය තනතුරු අට තව මත් හිස්ව තිබේ.

ආතතීන් ඇවිලීමට බලපෑ ක්ෂනික හේතුව වූයේ, ජවිපෙ සඳහා විශේෂයෙන් වෙන් කෙරුනු අමාත්‍යංශවල පාලනය යටතේ කලින් තිබූ මූලික දෙපාර්තමේන්තු වෙනත් අමාත්‍යංශවලට අනුයුක්ත කිරීමයි. ජාතික උරුමයන් හා සංස්කෘතික කටයුතු අමාත්‍යංශයට අයත්ව තිබූ, රජය සතු චිත්‍රපට සංස්ථාවේ පාලනය, කුමාරතුංග යටතට ම පවරා ගනු ලැබ ඇත. මෙම තීන්දුව පිලිබඳව නොදැන සිටි, නව ඇමති ලෙස නම් කෙරී තිබූ, ජවිපෙ මන්ත්‍රී විජිත හේරත්, ජාතික සංස්කෘතියට අනුකූලව, චිත්‍රපට සංස්ථාව දියුනු කිරීම සම්බන්ධ සිය අදහස් පැහැදිලි කරමින්, *ඉරිදා ලක්බිම* පත්‍රයට සම්මුඛ සාකච්ඡාවක් ද ලබා දුනි.

ඊට අමතරව, මහා පරිමාන මහවැලි වාරිමාර්ග ව්‍යාපෘතිය, කෘෂිකර්ම, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යංශයෙන් ඉවත් කොට, අලුතෙන් පිහිටුවන ලද ගංගා නිම්න සංවර්ධන අමාත්‍යංශය භාර ශ්‍රීලනිප ඇමතිවරයකුට පවරන ලදි. මෙම වාරිමාර්ග ව්‍යාපෘතියට, දස දහස් සංඛ්‍යාත සුලු ගොවීන් ජීවත් වන මධ්‍යම, උතුරු මැද සහ නැගෙනහිර පලාත්වල කොටස් ඇතුලත් වේ. ජවිපෙට මෙම ව්‍යාපෘතියේ පාලනය අවශ්‍ය වන්නේ, කලින් පැවති එක්සත් ජාතික පෙරමුනු (එජාපෙ) ආන්ඩුවට එරෙහි විරෝධතා ව්‍යාපාරවලට තෝතැන්නක් වූ මෙම ප්‍රදේශවල සිය ආනුභාවය පුලුල් කරගැනීම පිනිස ය. ජවිපෙ තව දුරටත් අවමානයට ලක් කරමින්, පශු සම්පත් දෙපාර්තමේන්තුව ද වෙනත් අමාත්‍යංශයකට අනුයුක්ත කර තිබේ.

මතභේදය පවතින්නේ, හුදෙක් අමාත්‍යංශ හා දෙපාර්තමේන්තු වෙන් කිරීම ගැන නො ව, නව ආන්ඩුවේ දිශාව පිලිබඳව ය. ආරම්භයේ පටන් ම, කුමාරතුංග, තමන් හා ශ්‍රීලනිපය අත තත්වයේ පාලනය මුලුමනින් ම පවතින බව සහතික කරගැනීම පිලිබඳව අධිෂ්ඨානවත් වී තිබේ. අප්‍රේල් 2 මැතිවරනයෙන්, ශ්‍රීලනිපයේ පාර්ලිමේන්තු ආසන 57ට සන්සන්දනාත්මකව ජවිපෙ ආසන 39ක් දිනා ගත් නමුත්, එතැන් පටන්, ජවිපෙ, විශාල වසයෙන් පසෙකට තල්ලු කෙරී පවතී.

මතභේද මුලින්ම මතු වූයේ, පසුගිය සතියේ දී මහින්ද රාජපක්ෂ අගමැති ලෙස පත් කිරීම පිලිබඳව ය. රාජපක්ෂට ජවිපෙට එරෙහි වීමේ දීර්ඝ ඉතිහාසයක් පවතින අතර, එජනිස සභාගය තැනීමට එරෙහිව ඔහු තර්ක කලේ, ඒ වෙනුවට එජාපෙ සමග මහා සන්ධානයක් තැනිය යුතු බවටයි. විකල්පයක් ලෙස, ජවිපෙ, හිටපු විදේශ ඇමති ලක්ෂ්මන් කදිරගාමර්ගේ නම යෝජනා කල නමුත්, එම යෝජනාව මුලුමනින් ම නො තකා හැරුනි.

සෙනසුරාදා දිවුරුම් දීමේ උත්සවයට පෙරාතුව, කැබිනට් තනතුරු අරභයා ඇතිවූ ගැටුම විසඳාගැනීමට ප්‍රයත්නයන් දරන ලදි. රැස්වීම් දෙකක් පැවැත්වුනි. එකක් ජනාධිපති මන්දිරයේ පැවති අතර අනෙක පැවතියේ, ශ්‍රීලනිපයේ මූලිකයකු හා ජවිපෙ සමග සන්ධානය ඇති කරගැනීමේ ප්‍රධාන අතරමැදියකු වූ ඇගේ සොහොයුරු අනුර බන්ඩාරනායකගේ නිවසේ ය. එහෙත් කිසිදු එකගතාවක් ඇති කරගැනීමට නො හැකි විය.

කොලඹ මාධ්‍යවලට අනුව, ජවිපෙ නායකයෝ, තම අදහස් නො විමසීම ද කැබිනට් මන්ඩලය තුලනාත්මක නො වීම ද පිලිබඳව තියුනු විවේචන එල්ල කලහ. ශ්‍රීලනිපයෙන් හා සෙසු එජනිස හවුල්කාර පක්ෂවලින් තේරී පත් වූ මන්ත්‍රීවරු 66න් 62කට ම තනතුරු ලැබුනත්, ජවිපෙ මන්ත්‍රීවරු 39න් කැබිනට් මන්ඩලයට ඇතුලත් වන්නේ 8ක් පමන ය. එපමනක් නො ව, ලංකා විදුලිබල මන්ඩලය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා ආයෝජන මන්ඩලය වැනි මූලික රාජ්‍ය සංස්ථාවලට සභාපතිවරුන් පත් කිරීමේ දී, ජනාධිපති ජවිපෙ නො තකා හැර ඇත.

සෙනසුරාදා පැවති රැස්වීමක කතා කරමින්, ජවිපෙ නායක සෝමවංශ අමරසිංහ, ශ්‍රීලනිපයට අනතුරු ඇඟවූයේ, එය නිසි පරිදි ක්‍රියා නො කල හොත්, බරපතල ප්‍රතිවිපාකවලට මුහුන දීමට සිදුවන බවටයි.

"මෙය සිදු වන්නේ නැතිනම්, මහජනතාව විරෝධතා මාර්ගයෙන් එවැනි දේවලට එරෙහිව සංවිධානය වෙමින් සිය බලය පාවිච්චි කල යුතු ය." මැතිවරනයේ දී ජවිපෙ, එජනිසට ලැබුනු ඡන්දවලින් සියයට 50කට වඩා දිනා ගෙන ඇති බවට ද ඔහු තර්ක කලේ ය. *ඩේලි මිරර්* පත්‍රයට අනුව, ජවිපෙ දේශපාලන මන්ඩලය, සති අන්තයේ රැස්වී, පක්ෂයේ ඉල්ලීම් නො ලැබුන හොත් කැබිනට් මන්ඩලයට එක් නො වීමට තීන්දු කලේ ය.

දෙපාර්ශ්වය අතර තාවකාලික සම්මුතියක් ඇති කරගැනීමට ඉඩ ඇති නමුදු, මෙම මතභේද මගින් අවධාරනය කෙරෙන්නේ, නව එජනිස ආන්ඩුවේ අතිශයින් ම අස්ථාවර ස්වභාවයයි. කුමාරතුංග සහ ශ්‍රීලනිපය, සිංහල ස්වෝත්තමවාදී ජවිපෙ සමග මැතිවරන සන්ධානයක් සඳහා හැරී ගත්තේ, තමන්ගේ ම සහයෝගී පදනම් දියවී යාම වලකාගැනීමේ විධික්‍රමයක් ලෙස ය. 2001 දී බලයට පත් වූ එජාපෙ මෙන් ම, ශ්‍රීලනිපය ද, 1994 සිට 2001 දක්වා ඔවුන් කලින් බලයේ සිටි කාල පරිච්ඡේදයේ දී, ජීවන මට්ටම් බැරෑරුම් ලෙස බාදනය කල, දරුනු ආර්ථික පිලිවෙත් ක්‍රියාවට දැමීම සම්බන්ධයෙන් වගකිව යුතු විය. ජවිපෙ, ප්‍රධාන පක්ෂ දෙකෙන් ම මහජනයා විරසක වීමේ වාසිය ගසාකමින්, අප්‍රේල් 2 දා සිය ඡන්ද ප්‍රමානයන් සැලකිය යුතු ලෙස වැඩි කරගැනීමට ද තම ආසන සංඛ්‍යාව 16 සිට 39 දක්වා දෙගුනයකටත් වැඩි ප්‍රමානයකින් ඉහල දමාගැනීමට ද සමත් විය.

ප්‍රධාන පක්ෂවල සහයෝගී පදනම් කඩා වැටීම, මනාප ලැයිස්තුවල ජවිපෙ දිනාගත් තැන මගින් ද අවධාරනය වේ. ශ්‍රී ලංකාවේ මැතිවරන ක්‍රමය යටතේ, ඡන්දදායකයෙක් පක්ෂ අපේක්ෂක ලැයිස්තුවක් තෝරනවා පමනක් නො ව, එම අපේක්ෂකයන්ගෙන් තිදෙනෙකුට සිය මනාපය ද දක්වයි. මැතිවරන දිස්ත්‍රික්කයක ආසන, එක් එක් පක්ෂයට සමානුපාතිකව වෙන් කෙරුනාට පසුව, තේරී පත් වන්නේ කුමන අපේක්ෂකයන් ද යන්න තීන්දු කෙරෙන්නේ, මනාපවලට අනුව ය.

ශ්‍රීලනිපය කම්පනයට පත් කරමින්, එජනිස ජය ලැබූ මැතිවරන දිස්ත්‍රික්ක 14න් බොහොමයක, මනාප ලැයිස්තුවල මුලට පැමිනියේ ජවිපෙ ය. කොලඹ හා කුරුනෑගල දිස්ත්‍රික්කවල, ශ්‍රීලනිපය හතර වන තැනට තල්ලු කරමින්, ජවිපෙ අපේක්ෂකයෝ, ප්‍රථම ස්ථාන තුන ම දිනාගති. ජවිපෙ ප්‍රචාරක ලේකම් විමල් වීරවංශ, ඕනෑම දිස්ත්‍රික්කයක එජනිස අපේක්ෂකයකු ලබා ගත් ඉහලම මනාප සංඛ්‍යාව ලැබූ අතර, ඔහු දෙවැනි වූයේ හිටපු අගමැති රනිල් වික්‍රමසිංහට පමනි. අනුරාධපුරයේ දී, ශ්‍රීලනිප දිස්ත්‍රික් නායක එච්.බී. සේමසිංහ ආසනයක් දිනාගැනීමට පවා අසමත් විය.

## තව දුර ගැටුම්

මූලික කරුනු දෙකක්, එජනිස සභාගය ඇතුලතත් ජවිපෙ ම තුලත් ආතතීන් තව දුර සංකීර්න කරනු ඇත. එනම්, ආර්ථික පිලිවෙත සහ දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය සමග සාම සාකච්ඡා ගෙනයාමයි.

අගමැති රාජපක්ෂ දැනටමත් පෙන්නුම් කර ඇත්තේ, එජනිසය, සිය ආර්ථික පොරොන්දු ඉටු කිරීමට සමත් වනු නැති බවයි. මාස තුනක දී රැකියා 30,000ක් ඇති කිරීම සහ රජයේ සේවකයන්ගේ වැටුප් සියයට 70කින් ඉහල දැමීම එම පොරොන්දුවලට ඇතුලත් වේ. ඔහු *සන්ඩේ ලීඩර්* පුවත්පතට මෙසේ පැවසී ය: "අපි සියලු අදාල වෘත්තීය සමිති සමග සාකච්ඡා ඇරඹීමට යන්නෙමු. අපි ඔවුනට සැබෑ තත්වය පෙන්වා දී, අප පොරොන්දු වූ සෑම දෙයක් ම එක රැයකින් ලබා දීම කෙතරම් නම් අසීරු ද යන වග පැහැදිලි කරන්නෙමු."

මේ සම්බන්ධයෙන් ක්‍රියාකලාපයක් ඉටු කරනු පිනිස ජවිපෙ ද කැඳවා තිබේ. අප්‍රේල් 12 දා *දි අයිලන්ඩ්* පත්‍රයේ පල වූ කතුවැකියක්, වර්ජන හා විරෝධතා නතර කිරීම පිනිස සිය වෘත්තීය සමිති ආනුභාවය යොදා ගන්නා ලෙස ජවිපෙ දිරිගැන්වී ය. "ජවිපෙට කම්කරු නොසන්සුන්තාව නැති කර දැමීමේ විභවය පවතී." යයි පුවත් පත උද්යෝගයෙන් පැවසී ය. "ඔවුන් ඇත්තට ම පුද්ගලික අංශයට සහාය දෙන්නේ නම්, දේශපාලනික ඇඟිලිගැසීම්වලින් තොරව හොඳින් සිය ව්‍යාපාර පවත්වා ගෙන යාමට ඒවාට ඉඩ දෙන්නේ නම්, ආර්ථිකය නිවැරදි කොට ආයෝජකයන්ගේ විශ්වාසය ගොඩනැගීමට ඔවුහු සමත් වනු ඇත."

කෙසේ වෙතත්, ජවිපෙ, මැතිවරන උද්ඝෝෂනය තුල දී ඔවුන් පොරොන්දු වූ පරිදි, මහ ව්‍යාපාරිකයන්ගේ ඉල්ලීම් ඉටු කල හොත්, ග්‍රාමීය හා නාගරික දුගීන් අතර එහි සහයෝගී පදනම් ශීඝ්‍රයෙන් විරසක වෙමින්, එම පක්ෂය තුල ම භේදයන් පිපිරීමට එම තතු තුඩු දෙනු ඇත.

සාම සාකච්ඡා සම්බන්ධයෙන් ගත හොත්, එජනිස පොරොන්දු වී ඇත්තේ. වත්මන් සටන් විරාමය ආරක්ෂා කරමින් එල්ටීටීඊය සමග සාකච්ඡා යලි අරඹන බවටයි. කෙසේ වෙතත්, මැතිවරනයට පෙරාතුව, ජවිපෙ, සාම ක්‍රියාදාමය දැඩි ලෙස හෙලා දකිමින්, එල්ටීටීඊය සමග ගෙනයන සාකච්ඡාවල දී එජාපෙ "රට පාවා දී ඇතැ"යි කියා සිටියේ ය. මිලිටරිය සමග එක්ව, ජවිපෙ සහ සෙසු ස්වෝත්තමවාදී කන්ඩායම් කුමාරතුංගට බල කලේ, ආන්ඩුවට එරෙහිව පියවර ගන්නා ලෙස ය. අවසානයේ පෙබරවාරි 7 දා ආන්ඩුව බලයෙන් පහ කර දමන ලදි.

මහ ව්‍යාපාරිකයන් හා මහ බලවතුන් යලි යුද්ධය කරා යාමකට අකැමති බව දන්නා, අගමැති රාජපක්ෂ, කොලඹ පාලනයේ කොන්දේසි මත එල්ටීටීඊය සාකච්ඡා මේසයට තල්ලු කරගනු පිනිස, ඉන්දියානු ආන්ඩුවේ සහයෝගය ලබා ගැනීමේ උත්සාහයක යෙදී සිටී. එහෙත් සාකච්ඡා ගෙන යන්නේ කුමන පදනමක් මත ද යන්න පිලිබඳව, ශ්‍රීලනිප හා ජවිපෙ අතර එකඟතාවක් නැත. ජවිපෙ එල්ටීටීඊයට මොන යම් හෝ සැලකිය යුතු සහනයක් දීමට සතුරු වන අතර, දිවයිනේ යුද-ග්‍රස්ත උතුරු හා නැගෙනහිර පලාත්වලට බලය සීමිත ලෙස විමධ්‍යගත ගත කිරීම පිලිබඳ

ශ්‍රිලනිපයේ සැලසුමට ද විරුද්ධ ය.

*දි අයිලන්ඩ්* කතුවැකිය කුමක් පැවසුවත්, ජවිපෙ ප්‍රථම වතාවට ආන්ඩුවට ඇතුලුවීම සම්බන්ධයෙන්, පාලක කව තුල එක්තරා නොසන්සුන්තාවක් පවතී. ජවිපෙ "සමාජවාදී" හා "මාක්ස්වාදී" වාග් පාඨ හඬතැලීම බැරෑරුම්ව ගන්නවා ඇත්තේ අතලොස්සක් දෙනා පමනි. එහෙත් ජවිපෙ, ගම්බද දුගීන් අතර පවත්නා සිය සහයෝගී පදනම් වෙතින් එල්ල වන පීඩනයට නතු විය හැකි බවටත් එබැවින් එය විශ්වාසනීය නො වන, අස්ථාවර සන්ධාන හවුල්කරුවකු වනු ඇති බවටත් උත්සුකතා පවතී.

කුමාරතුංගට, මේ මොහොතේ, ජවිපෙ මත රඳා පැවතීමෙන් වැලකිය නො හැකි වුවත්, ඇය සිය ආන්ඩුවට මුක්කු ගසාගැනීමේ වෙනත් මාවත් ද සෙවීමේ යෙදී සිටී. රටේ පවත්නා ඒකාධිපති හා මහජන විරෝධයට ලක්ව ඇති විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ කඩතුරාව යටතේ, කුඩා පක්ෂවලට වාසි සලසන, පවත්නා සමානුපාතික නියෝජන මැතිවරන ක්‍රමය වෙනස් කිරීමට ද ඇය යෝජනා කරයි. කුමාරතුංග දැනටමත් ජනාධිපති ලෙස දෙවරක් සේවය කොට ඇත. එබැවින් ඇය තෙවන වතාවටත් එම තනතුරට පත්වීමට නුසුදුසු ය. පාර්ලිමේන්තු ක්‍රමයට යලි මාරුවීම මගින්, තමන්ට විධායක බලතල සහිත අගමැති බවට පත්විය හැකි යයි ඇය ගනන් බලයි.

කෙසේ වෙතත්, ආන්ඩුවට අවශ්‍ය ව්‍යවස්ථා වෙනස්කම් සිදු කල හැකි දැයි යන්න කිසි සේත් ම පැහැදිලි නැත. යන්තම් ආසන 105ක් දිනාගෙන සිටින එජනිසයට ආසන 225කින් යුත් පාර්ලිමේන්තුවේ බහුතරයක් නැත. ව්‍යවස්ථා සංශෝධනයට, පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බහුතරයක් අවශ්‍ය ය. මේ අවස්ථාවේ කුමාරතුංගට හුදු බහුතරයක් වත් නැත. කලින් පැවති, ඒ ඒ මැතිවරන කොට්ඨාශයේ වැඩිම ඡන්ද සංඛ්‍යාව දිනා ගන්නා අපේක්ෂකයා තේරී පත් වන ක්‍රමය කරා ආපසු ගිය හොත් අතුගෑවී යාමට ඉඩ ඇති, බොහෝ කුඩා පක්ෂ, මොන යම් හෝ ව්‍යවස්ථා වෙනසකට විරුද්ධ ය.

මැතිවරනය හමාර වීමත් සමගම, කුමාරතුංග, කුඩා පක්ෂ ගනනාවක සහයෝගය දිනාගැනීමට උත්සාහ කල නමුත්, ඇය සමත් වූයේ, එජනිස ආසන සංඛ්‍යාව එකකින් වැඩි කරගැනීමට පමනි. ඒ ඊළම් ජනතා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ (ඊපීඩීපී) සහාය ලබා ගැනීමෙනි. ඇය දැන් යොමුවී සිටින්නේ, මැතිවරනයේ දී බෞද්ධ භික්ෂූන් අපේක්ෂකයන් ලෙස ඉදිරිපත් කල සිංහල අන්තවාදී පක්ෂයක් වන ජාතික හෙල උරුමය (ජාහෙඋ) වෙතටයි. ජාහෙඋ පසුගිය සති අන්තයේ පෙන්නුම් කලේ, තම මන්ත්‍රීවරු නව දෙනා එජනිසයට එක් නො වන නමුත්, පිටත සිට ආන්ඩුවට සහයෝගය දෙන බවයි.

කුමාරතුංග අගමැති ලෙස රාජපක්ෂ පත් කිරීමට එක හේතුවක් වූයේ, හෙල උරුමයේ සහාය දිනාගැනීමයි. දෙමල ජාතිකයකු වන ලක්ෂ්මන් කදිරගාමර් මෙන් නො ව, රාජපක්ෂට බෞද්ධ ධුරාවලිය සමග සමීප සබඳතා පවතී.

කුමාරතුංග, අත්‍ය-අසාමාන්‍ය පියවරක් ගනිමින්, හෙල උරුමයේ සහයෝගය දිනාගනු පිනිස මිලිටරියේ ඉහල නිලධාරින්ගේ සේවය ද ලබාගෙන තිබේ. ශ්‍රී ලංකා නාවික හමුදාවේ ප්‍රධානී, වයිස් අද්මිරාල් දයා සඳගිරි, හෙල උරුමයේ භික්ෂූන් හමු වී එජනිසයට සහාය දෙන ලෙස ඉල්ලා සිටියේ ය. පශ්චාත් මැතිවරන දේශපාලන උපාමාරු තුල, සඳගිරිගේ පාක්ෂික මැදිහත්වීම, රටේ ඉහල මිලිටරි නායකයන් විසින් ඉටු කරනු ලබන විවෘත දේශපාලන ක්‍රියාකලාපය පිලිබඳ තවත් දර්ශකයකි.

ආන්ඩුව හෙල උරුමය මත රඳා පැවැත්ම, එල්ටීටීඊය සමග සාකච්ඡා ආරම්භ කිරීමෙහි ලා පවත්නා දුෂ්කරතා තව දුරටත් සංකීර්න කරයි. හෙල උරුමය, මැතිවරනයට යන්තම් පෙරාතුව එය ගොඩනැගීමට එක් වූ සංවිධාන වන සිහල උරුමය සහ ජාතික සංඝ සම්මේලනය මෙන් ම, සටන් විරාමයට ද එල්ටීටීඊය සමග මොන යම් හෝ සාකච්ඡාවක් පැවැත්වීමට ද විරුද්ධ ය. පසුගිය වසරේ දී, සිහල උරුමය සහ ජාතික සංඝ සම්මේලනය, එල්ටීටීඊය සම්බන්ධයෙන් පමනට වඩා සම්මුතිවාදී වෙතැයි කියමින්, එජාපෙ පමනක් නො ව, කුමාරතුංගව ද විවේචනයට ලක් කල අතර, එල්ටීටීඊය සමග ගැටුමක් අවුලුවාගැනීමේ එල්ලයෙන් ප්‍රකෝපකරනයන් මාලාවක ම නිමග්න විය.

මැතිවරනයෙන් පසුව කුමාරතුංග ගත් ප්‍රථම පියවරයන්ගෙන් එකක් වූයේ, පරාජයට පත් වූ අගමැති වික්‍රමසිංහ හමුවීම ය යන්න, අර්ථභාරී කාරනාවකි. පසුගිය නොවැම්බරයේ දී ජනාධිපති මූලික අමාත්‍යාංශ තුනක් හිතුවක්කාරී ලෙස පවරාගැනීමෙන් අනතුරුව, මෙම නායකයන් දෙදෙනා, මාස ගනනාවක් තිස්සේ, තියුනු ගැටුමක නිමග්නව උන්හ. එහෙත් අප්‍රේල් 7 දා පැය දෙකක් තිස්සේ පැවති හමුව, "සුහදශීලී" එකක් ලෙස නිල වසයෙන් විස්තර කෙරුනු අතර, සංවේදී කරුනක් වන "සාම ක්‍රියාදාමය" පිලිබඳව ද එහි දී සාකච්ඡා විය. වත්මන් අවිනිශ්චිත තත්වයේ දී, කුමාරතුංග, පාලක පන්තියේ කොටස් වසර ගනනාවක් තිස්සේ ඉල්ලා සිටින, එජාපෙ සමග මහා සභාගයක් තැනීම ඇතුලු, සියලු විකල්ප සලකා බලන බවට, සැකයක් නැත.

පාර්ලිමේන්තු බහුතරයක් ස්ථාපිත කරගෙන ස්ථාවර ආන්ඩුවක් තැනීමෙහි ලා කුමාරතුංග දක්වා ඇති අපොහොසත් භාවය, කොලඹ සමස්ත දේශපාලන සංස්ථාපිතයම ඉරිතැලීමට ලක් කොට ඇති ගැඹුරටම විහිදුනු භේදයන් පෙන්නුම් කරයි. නව ආන්ඩුව මුහුන දෙන්නේ ද බලයෙන් පහවූ එජාපෙ මුහුන දුන් නො විසඳිය හැකි ප්‍රතිවිරෝධතාවන්ට ම ය. මෙම දහනශීලී තත්වයේ දී, කුමාරතුංග, මිලිටරියේ හා රාජ්‍ය යන්ත්‍රනයේ සහයෝගය සහිතව, ප්‍රජාතන්ත්‍ර විරෝධී පාලන ක්‍රමයන් වෙත වඩවඩා හැරී ගනියි.

© www.wsws.org